සීමාසහිත ලංකා ෆාස්ට් පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම
**Lanka Fast Publishers (Private) Limited**
178, 1/2, Old Kesbewa Road, Gangodawila, Nugegoda, Sri Lanka. Web:www.lankairida.lk
Administration : 0112 814 290, Editorial : 0114 958 925 Fax 0114 209 032 e-mail : lanka.editor@gmail.com Circulation : 0114 959 609
Marketing : 0114 899 374 e-mail : lankairida@gmail.com

2009.06.15

## 'අපි වෙනුවෙන් අපි අරමුදලින් තැනූ රණවිරු නිවාස මුදලට විකුණති'
## ප්‍රවෘත්තිය සම්බන්ධව කොළඹ පොලිස් අපරාධ කොට්ඨාශයෙන් පැමිණ
## ලංකා පුවත්පතේ කර්තෘවරයා ප්‍රශ්න කරයි

මහත්මයාණෙනි, මහත්මියනි,

පසුගිය 14 වැනි දින ''ලංකා'' ඉරිදා සංග්‍රහය පුවත්පතේ ප්‍රධාන පුවත ලෙස ''අපි වෙනුවෙන් අපි අරමුදලින් තැනූ රණවිරු නිවාස මුදලට විකුනති" යන ශීර්ෂයෙන් පළ කරණ ලද පුවත සම්බන්ධව විමසීමට යැයි කියමින් අද(15) දින නුගේගොඩ, ගංගොඩවිල, පරණ කැස්බෑව පාරේ, අංක 178/1/2 හි පිහිටි කාර්යාලයට 'එස්.අයි. විජේරත්න' යැයි තමන් හඳුන්වාදුන් පුද්ගලයකු පැමිණියේ ය.

තමන් කොළඹ අපරාධ කොට්ඨාසයේ සේවය කරන බව පැවසූ ඔහු පොලිස් නිල ඇඳුමක් ඇඳ සිටියේ නැත. පසුගිය සතියේ ලංකා පුවත්පතේ ප්‍රධාන ශීර්ෂපාඨය පෙන්වමින් ඔහු මගෙන් විමසා සිටියේ එම පුවතට අදාළ තොරතුරු ලැබුණේ කෙසේද? යන්නයි. අපගේ ප්‍රවෘත්ති මූලාශ්‍රයන් එසේ හෙළි කළ නොහැකි බව මම ඔහුට පැවසුවෙමි. එසේ නම් කොළඹ අපරාධ කොට්ඨාසයට පැමිණ 'ඩී.අයි.ජී අනුර සේනානායක' හමුවන ලෙස ඔහු මා වෙත පැවසීය. අනතුරුව, තම ජංගම දූරකථනයෙන් ඇමතුමක් ලබාගෙන, ඒ 'ඩී.අයි.ජී. අනුර සේනානායක' බව පවසා මා වෙත දුන්නේය. එහිදී දූරකථනයේ සම්බන්ධ වී සිටි අය මාගෙන් විමසා සිටියේ ද අප පුවත්පතේ ''අපි වෙනුවෙන් අපි අරමුදලින් තැනූ රණවිරු නිවාස මුදලට විකුනති" නමැති පුවතක් අප පුවත්පතේ පළවූයේ කෙසේද? යන්නයි. මම එවිටද පිළිතුරු දුන්නේ එවැනි විමසීමකට පිළිතුරු දිය නොහැකි බවයි. අනතුරුව එස්.අයි. විජේරත්න යැයි කියාගත් පුද්ගලයා මා හට පැවසුවේ කොළඹ අපරාධ කොට්ඨාසයට පැමිණ ඩී.අයි.ජී. අනුර සේනානායක හමුවන ලෙසයි. එහෙත් මා එසේ ගියේ නැත.

පුවත්පතේ පළවූ පුවතක් පිළිබඳව ප්‍රධාන කොළඹ අපරාධ කොට්ඨාසයට විමසීමක් කිරීමට අවශ්‍ය නම් එය ලිඛිතව මා වෙත යොමු කළ හැකිව තිබිණි. එසේම සිවිල් ඇඳුමින් කාර්යාලයට පැමිණ පුවතට අදාළ විස්තර විමසා සිටීම පොලිස් දෙපාර්තමේන්තුවට අයත් කාර්යයක් ලෙස සිතිය නොහැකි නිසාත් එවැන්නක් සිදුකිරීමට අවශ්‍ය වන්නේ නම් මෙබඳු ක්‍රමවේදයක් අනුගමනය කිරීම පිළිගත හැකි නොවන නිසාත් මෙබඳු ප්‍රශ්න කිරීමක් ජනමාධ්‍ය වෘත්තියේ නිරතවන මා හටත් අප ආයතනයේ සාමාජිකයන්ටත් කළ තර්ජනයක් ලෙස සලකමි.

මෙම සිදුවීම පිළිබඳවත් ජනමාධ්‍ය ආයතනයකට මෙවැනි අයුතු බලපෑමක් සිදුකිරීම පිළිබඳවත් පුවතට ඔබ ආයතනයේ මාධ්‍යයෙන් ඉඩක් ලබා දෙන ලෙස ඉල්ලා සිටිමි.

ස්තූතියි,

මෙයට

..............................

(චන්දන සිරිමල්වත්ත)
ප්‍රධාන කර්තෘ - ලංකා ඉරිදා සංග්‍රහය